නාරම්මල ප්‍රාදේශීය සභාව.

කුරුණෑගල දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබී තිබූ රු.1,946,897 ක් වටිනා වාහන 2 ක් මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.900,000 ක් අඩුවෙන් දක්වා තිබුණ අතර, වර්ෂ අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂය වූ රු.61,498 ක් ගිණුම්ගතවී නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම රු.36,652,361 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.30,595,472 ක් ලෙස රු.6,056,889 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). 2012 වර්ෂයේදී අංක 53-5721 දරන කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.1,444,500 ක් වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ). අලව්ව ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු රු.499,812 ක මුදල ජ'නල් සටහන් අංක 68 මගින් අත්තිකාරම් ගිණුම හර කර තිබියදී, නැවත වතාවක් එකී ගිණුමට එම වටිනාකම හර කිරීමෙන් වර්ෂය අවසානයට අත්තිකාරම් ශේෂය රු.499,812 ක් වැඩියෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ඉඩම් හා ගොඩනැගිලි ශේෂය වූ රු.26,090,358 තුල සමාලෝචිත වර්ෂයේදි ඉවත් කරන ලද රු.15,000 ක් වටිනා විදුලි ගබඩා ගොඩනැගිල්ල හා රු.312,427 ක් වූ පොදු වෙළඳපල හා බස්නැවතුම්පල ගොඩනැගිලිවල අගයද ඇතුලත්ව තිබුණි.

(උ). ඉකුත් වර්ෂයට අදාල ණයහිමියන් ලෙස ප්‍රතිපාදනය නොවූ රු.85,250 ක් සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කිරීමේදී ජ'නල් සටහන් අංක 59-1 මගින් ප්‍රාග්ධන වැය ගිණුම හර කර ණයහිමි ගිණුම බැර කර තිබීමෙන් ප්‍රාග්ධන වැය හා ණය හිමියන් රු.85,250 බැගින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඌ) වර්ෂය ආරම්භයට පැවති තැන්පත් ගිණුමේ ශේෂයන් තැන්පතු ලේඛනයේ වූ අනුරූපී ශේෂයන් සමඟ ගැලපීම සඳහා ජ'නල් සටහන් අංක 62, 63, 64, 65 හා 66 මගින් රු.1,146,310 ක් සමුච්චිත අරමුදල හර කර තැන්පතු ගිණුම් බැර කර තිබුණු අතර, ජ'නල් සටහන් අංක 67 මගින් රු.51,815 ක් සමුච්චිත අරමුදල බැර කර තැන්පතු ගිණුම් හර කර තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් 06 ක ගිණුම අනුව හා අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 1,486,261 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.27,921,373 ක් වූ අතර, එයින් රු. 6,061,762 ක් වසර 1 ත් 3 ත් අතර කාලයකට අදාල විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.18,945,895 ක් විය.

1.3.4 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.11,381,418 ක් වටිනා කර්මාන්ත ණයහිමි ශේෂයක් විධිමත් පරිදි හඳුනා ගැනීමකින් තොරව ජ'නල් සටහන් අංක 55 මගින් සමුච්චිත අරමුදලින් කපාහැර තිබුණි.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.2,293,799 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.12,181,622 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.9,887,823 ක පිරිහීමක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.24,932,729 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.32,945,587 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රතිඵලය රු.5,719,059 ක ඌණතාවයක් බවට පත්වී තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.56,483,260 න් සියයට 54 ක් වූ රු.30,595,170 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.24,932,729 කින් සියයට 84 ක් වූ රු.21,041,549 ක ප්‍රමාණයක් ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.54,189,460 න් සියයට 58 ක් වූ රු.31,432,744 ක මුදලක් පෞද්ගලික පඩිනඩි සඳහා වැය වී තිබුණු අතර ඉන් රු.18,392,388 ක් හෙවත් සියයට 59 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබුණි. ප්‍රාග්ධන වියදම වූ රු.32,945,587 න් සියයට 18 ක් හෙවත් රු.6,164,889 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබුණු අතර, ඉතිරි සියයට 82 ක් වූ රු.26,780,698 ක ප්‍රමාණය වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 <u>කාරක ප්‍රාග්ධන කළමනාකරණය</u>

විගණනයට ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2011 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවත එන එකතුව රු. 113,625 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

2.4 <u>ආදායම් පරිපාලනය</u>

2.4.1 <u>ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය</u>

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදි එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රයේදි එකතු කර තිබුණි.

2.4.2 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 සිට 67 දක්වා රීති ප්‍රකාරව සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් වෙත දින 7 ක් ඇතුලත පනවන බද්ද ගෙවන ලෙස නියම කළ යුතු වූවද, එසේ කටයුතු කර නොතිබුණි.

2.4.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.805,784 ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

සභාව විසින් 2011 සිට 2013 වර්ෂය දක්වා වූ කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 226 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 194 ක් විය. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණේ නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.38,800 ක ආදායමක් සභාවට උපයාගත හැකිව තිබු අතර, ඉදිකිරීම් අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු අයකිරීමට සභාවට හැකියාව තිබුණි.

3.2 <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

2011 වර්ෂයේදී රු.275,500 වැයකර ලබාගන්නා ලද කුට්ටිගල් යන්ත්‍ර දෙකෙන් 2011 ඔක්තෝබර් මාසයෙන් පසුව කුට්ටිගල් නිෂ්පාදනයක් කර නොතිබුණි. නැවත 2011 දෙසැම්බර් මාසයේදී රු.135,000 වැයකර අදාල පරිශ්‍රයේ බ්ලොක් ගල් යන්ත්‍ර දෙකක් සවිකර තිබුණද 2012 පෙබරවාරි මාසයෙන් පසුව බ්ලොක් ගල් නිෂ්පාදනයක්ද සිදුව නොතිබුණි.

04. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව රු.115,500,000 ක ප්‍රාග්ධන ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද, එයින් ලභාවී තිබුණේ සියයට 22 ක් ලෙස රු.24,932,729 ක් පමණි.

05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය

(ඇ). අයවැය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). වත්කම් කළමනාකරණය